# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය, හෝමාගම.

## දෙවන වාර පරීක්ෂණය - 2013

**බුද්ධ ධර්මය**

**6 ශ්‍රේණිය**

කාලය - පැය 2 යි

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |

නම: ..................................................... පංතිය: .....................................................

### පළමු පත්‍රය

- නිවැරදි පිළිතුරේ අංකය වරහන තුළ ලියන්න.

1) විහාරස්ථානයට ගොස් අප වන්දනාමාන කළ යුතු පිළිවෙල වනුයේ

(i) බොධීන් වහන්සේ,පිළිම වහන්සේ,වෙහෙර වහන්සේ

(ii) වෙහෙර වහන්සේ, පිළිම වහන්සේ, බෝධීන් වහන්සේ

(iii) පිළිම වහන්සේ, වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ

(iv) වෙහෙර වහන්සේ, බොධීන් වහන්සේ, පිළිම වහන්සේ ( )

2) බුදුන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කළේ බුද්ධත්වයෙන්

(i) තෙවන මස මැදින් පොහොය දිනයේදී

(ii) පළමු මස වෙසක් පොහොය දිනයේදීය

(iii) නවවැනි මස පොසොන් පොහොය දිනයේදීය

(iv) පස්වැනි මස මැදින් පොහොය දිනයේදීය ( )

3) "මා ඇසතු බොරුක මුලදී ලබා ගත් සප්ත ආර්‍ය ධනයක් ඇත.මා සමඟ එන්න.එය ලබා දෙන්නෙමි" යනුවෙන් බුදු හිමියන් පැවසුවේ,

(i) රාහුල කුමාරයාට (iii) ජන්න ඇමතියාට

(ii) නන්ද කුමරුට (iv) පස්වග මහණුන්ට ( )

4) චුල්ලරාහුලෝවාද සූත්‍රය අසා සියලු කෙලෙසුන් නසා රහත් බවට පත් වූයේ

(i) නන්ද කුමරුය (iii) සුද්ධෝධන රජතුමාය

(ii) පස්වග මහණුන්ය (iv) රාහුල හිමියනාය ( )

(VII) "නහි වේරේන වේරානි" යන ධම්ම පදයේ එන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(VIII) වැඳුම් පිදුම් කිරීම සඳහා විහාරස්ථානයට යාමේදී අප රැගෙන යා යුතු දේවල් 5ක් ලියන්න.

(ල: 2X8=16)

(2) (I) දූ දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් 5 ක් ලියන්න . (ල:2)

(II) සිල්වත් වීම තුළින් ඇතිවන ප්‍රයෝජන 5ක් ලියන්න. (ල:4)

(III) චාරිත්‍ර සීලයට උදාහරණ 3 ක් දෙන්න. (ල:5)

(3) (I) විහාරස්ථානයට ගොස් වැඳුම් පිදුම් කිරීමට පෙර අප විසින් සිදුකරනු ලබන වත් පිළිවෙත් 2 ක් ලියන්න. (ල:2)

(II) රාහුල හිමියන්ගෙන් ශිෂ්‍ය ජීවිතයකට හැකි ප්‍රයෝජන 4 ක් ලියන්න. (ල:4)

(III) හොඳ ශිෂ්‍යයකු ලෙස පන්ති කාමරයේ දී කටයුතු කළයුතු ආකාරය පිළිබඳව පැහැදිලි කරන්න. (ල:5)

(4) (I) චෛත්‍යරාජයාණන් වහන්සේට වඳින ගාථාව ලියන්න. (ල:2)

(II) මෛත්‍රී භාවනාව වැඩීමෙන් ඇතිවන ගුණාංග 4 ක් ලියන්න. (ල:4)

(III) චූල්ලතිස්ස හිමියන්ගේ චරිතයේ දැකිය හැකි දුර්වල ලක්ෂණ 5 ක් ලියන්න. ( ල:5)

(5) (I) සම්මා ආජීව යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල:2)

(II) උපෝසථ අෂ්ටාංග සීලයට අයත් වන සිල්පද මොනවද? (ල:4)

(III) අත්ථස්සද්වාර ජාතකයට අනුව කෙනෙකු දියුණු වීමට හේතු වන කරුණු 5ක් ලියන්න. (ල:5)

(6) (I) "සියල්ලෝම දඬුවමින් තැති ගනිති.සියල්ලෝම මරණයට බිය වෙති. එහෙයින් තමා උපමා කොට අනුන් නොමරන්න.නොමරවන්න." යන අදහසට අදාළ වන ධම්ම පදයේ ගාථාව ලියන්න. (ල:2)

(II) පහත වචන වල ශාසනික ව්‍යවහාර ලියන්න.

i. කනවා  
ii. නිදියනවා  
iii. යනවා  
iv. අතුගානවා (ල:4)

(III) " මහනෙල් සුවඳ මය  
කුඩ මසු පිළී ගඳ මය  
දෙකට එක දියමය  
හොඳට නරකට දෙකට කටමය " යන කවියේ තේරුම ලියන්න. (ල:5)

(ii) පැවිදි උතුමන්ට වන්දනා කිරීම (iv) ගරු කළ යුත්තන්ට ගරු කළයුතු බවයි ( )

15) වාචසික සංවරය ඇතිකරගතයුතු ආකාර

(i) 3 කි (ii) 2 කි (iii) 4 කි (iv) 6 කි ( )

16) දෙවි-බඹ ආදීන්ට ධර්මය දේශනා කිරීම සඳහා බුදුන් වහන්සේගේ දින චර්යාවෙන් වෙන් කළේ

(i) මැදියම් කිස (iii) පසුබත් කිස

(ii) පෙරබත් කිස (iv) පෙරයම් කිස ( )

17) යහපත් ගමන් විලාසය ඇති හෙයින්ද යහපත් දේශනා විලාසය ඇති හෙයින්ද, සුන්දර වූ නිවන් මහට පිවිසි හෙයින්ද බුදුන් වහන්සේ,

(i) ලෝකවිදූ නම්වන සේක (iii) සුගත නම් වන සේක

(ii) අනුත්තරෝ පුරිස ධම්ම සාරථී නම් වන සේක.(iv)සම්මා සම්බුද්ධ නම් වන සේක( )

18) බුදුන් වහන්සේගේ ගුණ මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව,

(i) ආනාපානසති භාවනාව (iii) මෛත්‍රී භාවනාව

(ii) බුද්ධානුස්සති භාවනාව (iv) සමථ භාවනාව ( )

19) තමන් කළ දෙයක් වැරදි නම් එය වැරද්දක් ලෙස පිළිගෙන යළි නොකර සිටීම

(i) ආයති සංවරයේ පිහිටීමයි (iii) මානසික සංවරයේ පිහිටීමයි

(ii) අත්තූපනායික ධර්මයයි (iv) වැරැද්දක් කළ පසු සමාව අයදීමයි ( )

20) රාහුල හිමියන් රහත් බවට පත්වූයේ වයස අවුරුදු

(i) 07 දීය (ii) 20 දීය (iii) 15 දීය (iv) 10 දීය ( )

(ල: 2X20=40)

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

(1) (I) ප්‍රිය වචන කතා කිරීමේ අගය පැහැදිලි කරන ජාතක කතාවේ නම ලියන්න.

(II) "ත්‍රිකෝටික පාරිශුද්ධි සීලය" නම් කරන්න.

(III) "අත්තූපනායික ධර්මය" යනු කුමක්ද?

(IV) තිදොරින් සිදුකෙරෙන වැරදි වෙන වෙනම දක්වන්න.

(V) රාහුල හිමියන්ට බුදු සසුනේ හිමි වූ අග තනතුර කුමක්ද?

(VI) සම්මා කම්මන්තයට අයත් වන්නේ කුමක්ද?

5) තපෝ වෘද්ධ වශයෙන් සඳහන් වනුයේ,

(i) තැන්පත් බවින් වැඩි බවයි (iii) නුවණින් වැඩි බවයි

(ii) වයසින් වැඩි බවයි (iv) භාවනානුයෝගීව වැඩ වසන බවයි. ( )

6) චාරිත්‍ර සීලය වශයෙන් අප සළකනුයේ,

(i) කළයුතු දේවල්ය (iii) වැරදි දේ කිරීමෙන් වැළකීමයි

(ii) නොකළයුතු දේවල්ය (iv) අප කළයුතු සිරිත් වේ. ( )

7) තමා උසස් කොට සලකා අන් අය පහත්කොට සැලකීම

(i) අත්තුක්කංසනයයි (iii) අත්තුපනායික ධර්මයයි

(ii) පරවම්භනයයි (iv) ත්‍රිකෝටික පාරිශුද්ධියයි ( )

8) ප්‍රයෝජනයක් ඇති දේ පමණක් කතා කිරීම

(i) වාචසික කුසල්ය (iii) සම්මා කම්මන්තයයි

(ii) සම්ප්‍රප්පලාපයයි (iv) සම්මා ආජීවයයි ( )

9) ලෝකය ශිෂ්ටාචාරවත් බවට පත්වූයේ

(i) ජනගහනය වැඩිවීම නිසාය (iii) ප්‍රිය වචන නිසාවෙනි

(ii) ආගම් ප්‍රචාරය වීම නිසාය (iv) නිවාස ඉදිවීම නිසාය ( )

10) ගිහි සීලය ප්‍රධාන වශයෙන් කොටස්

(i) 4 කි (ii) 2 කි (iii) 3 කි (iv) 5 කි ( )

11) සිංහල ජාතක කතා පොත ලියවුණේ

(i) කෝට්ටේ යුගයේදිය (iii) අනුරාධපුර යුගයේදිය

(ii) කුරුණෑගල යුගයේදිය (iv) දඹදෙණිය යුගයේදිය ( )

12) අනුන් පහත් කොට සැළකීම

(i) අත්තුක්කංසනයයි (iii) පරාභවයයි

(ii) පරවම්භනයයි (iv) කුල හීනත්වයයි ( )

13) දරුවන්ගේ දියුණුව දැක සතුටු වීමේ ගුණය

(i) මෙත්තා ගුණයයි (iii) උපේක්ඛා ගුණයයි

(ii) මුදිතා ගුණයයි (iv) කරුණා ගුණයයි ( )

14) 'ගාරවෝච' යන්නෙන් අදහස් වන්නේ

(i) වැඩිහිටියන්ට සැලකීම (iii)යහපත් වචන කතා කිරීම